# රාජසන්තක කළ ස්වර්ණාභරණ ජනපති නියමයෙන් නිදහස්

මත්තල මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළේදී සිදුකරන ලද ප්‍රථම අත්අඩංගුවට ගැනීම ලෙස සැලකෙන නීති විරෝධීව ලංකාවට ගෙන ආ රාජසන්තක කරන ලද ස්වර්ණාභරණ තොගය ජනපති මහින්ද රාජපක්ෂගේ නියෝගයක් අනුව ශ්‍රී ලංකා රේගුව මුදා හැර ඇතැයි වාර්තා වේ.

රේගු විෂයභාර මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපතිවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම මුදාහැරීම සිදුකරන ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කර ඇති අතර ඒ අනුව ස්වර්ණාභරණ තොගය හා අදාළ ව්‍යාපාරිකයාට මුදාහැර තිබෙන බව වාර්තා වෙයි.

පසුගිය ජූනි මස 12 වැනිදා උදෑසන 8.05ට යූඑල් 827 දරන ගුවන් යානයෙන් බැංකොක් නගරයේ සිට පැමිණ මත්තල මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළෙන් බැස පිටවී යෑමට උත්සාහ කිරීමේදී අදාළ ස්වර්ණාභරණ තොගය සමග එම ව්‍යාපාරිකයා අත්අඩංගුවට ගෙන ඇති අතර කොළඹ කේන්ද්‍රීයව ස්වර්ණාභරණ වෙළෙඳාමේ යෙදෙන අදාළ ව්‍යාපාරිකයා හම්බන්තොට මහ නගර සභාවේ නගරාධිපති එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දුගේ ඥාතියෙකු වශයෙන් එම දිනවල මාධ්‍ය වාර්තාකර තිබුණි.

එම ව්‍යාපාරිකයා විසින් ගෙන එන ලද ස්වර්ණාභරණ තොගයේ වටිනාකම රුපියල් තුන්කෝටියකට අධික බව රේගුව විසින් ගණනය කර තිබූ අතර ඒ සඳහා රුපියල් ලක්ෂ 25ක දඩයක් ද නියම කර තිබුණි.

මේ පිළිබඳව කරන ලද විමසීමකදී රේගු මාධ්‍ය ප්‍රකාශක ලෙස්ලි ගාමිණී මහතා පැවසුවේ අදාළ ලිපිගොනුව පරීක්ෂා නොකර කිසිවක් ප්‍රකාශ කළ නොහැකි බවයි.

රේගු අධ්‍යක්ෂ ජනරාල් ජගත් විජේවීර මහතාගෙන් මේ පිළිබඳව කළ විමසීමේදී ඔහු ප්‍රකාශ කළේ මුදල් අමාත්‍යවරයාගෙන් එවැනි ලිපියක් ලැබුණු බවට මතකයක් නැති බවත්, තමා සාකච්ඡාවක නිරතවන බැවින් පසුව අමතන ලෙසත්ය. එහෙත් ඉන්පසු කිහිප අවස්ථාවකදීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා දුරකථනයට සම්බන්ධකර ගැනීමට උත්සාහ කළ ද එය සාර්ථක නොවීය.

ශ්‍රී ලංකාවට නීති විරෝධීව ගෙන ඒම හෝ ශ්‍රී ලංකාවෙන් නීති විරෝධීව රැගෙන යන ඕනෑම භාණ්ඩයක් පිළිබඳ පරීක්ෂණ සිදුකර ඒවා රාජසන්තක කිරීමටත්, දඩ ගැසීමටත් රේගුවට හැකියාව ඇති අතර එම රේගු පරීක්ෂණය සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවන්නේ නම් එම නීති විරෝධි ක්‍රියාවට හසුවූ පුද්ගලයාට මුදල් ඇමතිවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරිමේ හැකියාව පවතී. ඉන්පසු රේගුවේ තීරණය පිළිගැනීමේ හෝ එය ප්‍රතික්ෂේප කර රාජසන්තක කළ භාණ්ඩ මුදාහැරීම සඳහා නියෝගයක් කිරීමේ බලය අමාත්‍යවරයාට හිමිවේ.

රට තුළට රත්තරන් හෝ ස්වර්ණාභරණ ගෙන ඒම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් ලබාගත යුතු අතර ස්වර්ණාභරණ සමග මත්තල ගුවන් තොටුපොළේ දී අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෝ ඊට පසු පැවති පරීක්ෂණවලදී අදාළ ව්‍යාපාරිකයා එවැනි අවසරයක් ඉදිරිපත් නොකළ බවද වැඩිදුරටත් වාර්තා වේ. ■



# වැය ශීර්ෂයේ
# ආරක්ෂාවට හා

2014 වර්ෂයට අදාළ අ
පනත් කෙටුම්පත පාර්ලි
පසුගිය ඔක්තෝබර් නමවැ
ඇස්තමේන්තුගත රජයේ
1,542,252,518,000/-කි.) මේ
පියවා ගැනීම වෙනුවෙන්
ලබාගත හැකි බවද විසර්ජ

මේ ඇස්තමේන්තුගත රා
යන්න පිළිබඳව හා එම වි
පිළිබඳව මුදල් හා ක්‍රමසම්පා
නොවැම්බර් මස 21 වැනිදා
කිරීමට නියමිතය.

කැසිනෝවලට බදු සහන
නිවේදන පාර්ලිමේන්තුවේ
මාධ්‍යවල ඉඩ හසර ලබා ගැ
පිළිබඳව මාධ්‍යවල එතරම්
ඇස්තමේන්තු ගැන පළවූ
ගැන නිවැරදි චිත්‍රයක් පොදු

සුපුරුදු පරිදිම 2014 වර්ෂ
වෙන්කර ඇත්තේ ආරක්ෂක
හා නාගරික සංවර්ධන අමා
253,902,910,000/-) වශයෙන්
තිබුණේ 2013 වර්ෂයේදී ආර
වඩා රුපියල් බිලියන 35.6
වර්ෂයේදී ආරක්ෂක විෂයට රු